ඇ. යු. — 2014.12.19 දින පළ වූ අංක 1,894 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (*අ*) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,895 - 2014 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.12.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 3282 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 16 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3281- B 80905— 2,877 (2014/12)
F 1 -

# පළාත් සභා නිවේදන

## නැගෙනහිර පළාත් සභාව

2014 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය (පරිපූරක විධිවිධාන) 2014 දෙසැම්බර් මස 01 වැනි දින සභා සම්මත කරන ලද බවත්, මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2014 දෙසැම්බර් මස 05 වැනි දින ලැබී ඇති බවත් මෙයින් දන්වමි.

එම්. සී. එම්. ෂෙරිෆ්,
සභා ලේකම්,
නැගෙනහිර පළාත් සභාව.

සභා ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

2014 දෙසැම්බර් මස 08 වැනි දින.

12-918

---

## ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 4 දරන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය අනුව ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කිරීම

ඌව පළාත් සභාවේ 2010 අංක 4 දරන ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියෙහි 5 (1) හා 7 (1) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ ක්‍රීඩා, යෞවන කටයුතු, විදුලිබල හා බලශක්ති, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත සහ සමුපකාර අමාත්‍ය චාමර සම්පත් දසනායක වන මම මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමු තීරුවේ සඳහන් අය ඔවුන් වෙත නියම කර ඇති තනතුරු යටතේ ඌව පළාත් සීමාව තුළ පමණක් බල පැවැත්වෙන පරිදි, උපලේඛනයේ දෙවන තීරුවේ සඳහන් කාල සීමාව සඳහා මෙයින් පත් කරමි.

චාමර සම්පත් දසනායක,
ක්‍රීඩා හා යෞවන කටයුතු, විදුලිබල හා බලශක්ති,
පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත සහ සමුපකාර අමාත්‍ය.

2014 නොවැම්බර් මස 27 වැනි දින.

උපලේඛනය

| | *1 වැනි තීරුව* | *2 වැනි තීරුව* |
|---|---|---|
| (1) | නීතිඥ ඩී. සුජීව සනත් වරුණ ජයසිංහ මහතා,<br>(ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති)<br>අංක 66,<br>බණ්ඩාරනායක මාවත,<br>බදුල්ල. | 2014 ඔක්තෝබර් 29 සිට 2017 ඔක්තෝබර් 30 දක්වා |
| (2) | කේ. එම්. නන්දසේන මහතා,<br>(ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික)<br>ගුරුපුර,<br>රිදීපාන. | 2014 ඔක්තෝබර් 29 සිට 2017 ඔක්තෝබර් 30 දක්වා |
| (3) | (03) එච්. එම්. වීරකෝන් බණ්ඩා මහතා,<br>(ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජික)<br>අංක 265,<br>බඩල්කුඹුර. | 2014 ඔක්තෝබර් 29 සිට 2017 ඔක්තෝබර් 30 දක්වා |

12-756

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.